**වාරියපොල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වාරියපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.278,125 ක් වූ දෙනිපොතේලන්ද මූකලාන ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.218,125 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබුණු රු.6,009,602 ක් වූ ටිපර් රථයක වටිනාකම රු.8,500,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) කර්මාන්ත 03 කට අදාළව ලැබී තිබුණු රු.523,775 ක් ණයගැති ගිණුමෙන් අඩුකර දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඉ) ආදායම් අංශයේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ හා වරෙන්තු ගාස්තු රු.6,481,721 ක් වුවද, ආදායම් වියදම් ගිණුමේ එය රු.5,946,771 ක් ලෙස දක්වා තිබුණි.

(ඊ) ආදායම් අංශයේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු උසාවි දඩ රු.2,718,850 ක් වුවද, ශේෂ පත්‍රයේ රු.2,183,900 ක් ලෙස දක්වා තිබුණි.

(උ) උපලේඛනය හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු.630,997 ක් වූ සමාලෝචිත වර්ෂය අවසානයට ලිපි ද්‍රව්‍ය තොගය, ශේෂ පත්‍රයේ රු.443,447 ක් ලෙස දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛන අනුව ශේෂයන් අතර රු.33,610 ක වෙනසක් පැවතුණි.

(ආ) ගිණුම් විෂයයන් 09 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා ස්ථාවර වත්කම් ලේඛනය/සභාවෙන් ලබාදුන් තොරතුරු අනුව ශේෂයන් අතර රු.2,789,301 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබියයුතු ගිණුම්

--------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.224,594,623 ක් වූ ලැබියයුතු ගිණුම්වලින් වර්ෂයකට වැඩි කාලයක් ඉක්මවා තිබුණු රු.1,016,667 කින් රු.164,250 ක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර ඉතිරි රු.852,417 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

---------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.219,980,516 ක් වූ ගෙවියයුතු ගිණුම්වලින් වර්ෂ 1 ත් 3 අතර කාල පරිච්ඡේදයක සිට පැවති රු.942,971 ක් හා වර්ෂ 03 ට වැඩි රු.4,570,926 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

----------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,482,198 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) 2016 වර්ෂයට පෙර සිට පවතින කර්මාන්ත ණයගැති ශේෂ හඳුනාගැනීම සඳහා වූ ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර, ඉකුත් වර්ෂයේදී සභාව විසින් ඉවුකළ කර්මාන්ත 110 කට අදාළව රු.15,893,439 ක් ලැබී ඇති බව දක්වා තිබුණද, ඒ පිළිබඳ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ට්‍රැක්ටරයට සවිකරන රු.175,000 ක් වූ කැලය කපන යන්ත්‍රයක වටිනාකම යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර ඇති බව දක්වා ඇතත් සනාථ කරන තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| 99 රීතිය | 439,681 | 2017 ජනවාරි මාසයට අදාළ වවුචර් 11 ක් සහතික නොකර ගෙවීම් සිදුකර තිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| (i) 3.4.2 (අ) වගන්තිය | 1,293,925 | මිල ගණන් කැඳවීමෙන් තොරව ඉන්වෙන්ට්‍රි හා පාරිභෝගික භාණ්ඩ මිලදීගෙන තිබුණි. |
| (ii) 5.6හා 6.2.2 වගන්තිය | 1,206,338 | පිරිවිතර ඉදිරිපත් කර නොතිබුණු අතර, ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාල සීමාව සපුරා නොතිබුණි. |
| (iii) 6.3.3 වගන්තිය | 1,864,713 | ලංසු විවෘත කරන දිනය, වේලාව හා ස්ථානය සඳහන් කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | වාහන අළුත්වැඩියා කිරීම් අභ්‍යන්තර/බාහිර ලෙස වර්ග කර චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 චක්‍රලේඛය | - | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.75,388,023 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.61,435,397 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . | රු000 . |
| (I) වරිපනම් හා බදු | 5,169 | 6,065 | 6,202 | 554 | 4,880 | 5,617 | 5,617 | 692 |
| (II) බදු කුලී | 9,889 | 10,604 | 10,692 | 02 | 9,383 | 9,320 | 9,302 | 90 |
| (III) බලපත්‍ර ගාස්තු | 772 | 1,189 | 1,189 | - | 742 | 932 | 932 | - |
| (IV) වෙනත් ආදායම් | 168,084 | 177,085 | 174,442 | 37,557 | 165,095 | 166,207 | 166,208 | 34,914 |
| එකතුව | 183,914 | 194,943 | 192,525 | 38,113 | 180,100 | 182,076 | 182,059 | 35,696 |

සටහන

2017 රැස්කළ ආදායම් අගය තුළ පසුගිය වර්ෂවලට අදාළ හිඟ ලැබීම් රුපියල් මිලියන 35 ක්ද ඇතුළත්ව තිබුණි.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

----------------------------------

සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 183 ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තුගත කර තිබුණද, ඉකුත් වර්ෂයන්ට අදාළ හිඟ ආදායම් ලැබීම් රුපියල් මිලියන 35 ක්ද ඇතුළුව රුපියල් මිලියන 192 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 35 ක් වූ හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රුපියල් මිලියන 38 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.692,000 ක් වූ වරිපනම් බදු හිඟයෙන් වර්ෂයකට වඩා වැඩි කාලයක් තුළ හිඟව පවතින රු.250,559 ක් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා අනුගමනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.141,090 ක් වූ අක්කර බදු හිඟයෙන් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින රු.66,908 ක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුලී**

-----

වාර්ෂික ටෙන්ඩර් මත බදුදී තිබුණු වත්කම් 03 කට අදාළව වර්ෂ ගණනාවක සිට අයවීමකින් තොරව පවතින රු.164,250 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් නීත්‍යානුකූලව කටයුතු කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් එම මුදල් අයවී නොතිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වාහන කුලියට දීමෙන්, ගලී රථ කුලියට දීමෙන් හා ජල බවුසරය වෙනුවෙන් ලැබියයුතු ආදායම් පිළිවෙලින් රු.147,800 ක්, රු.25,250 ක් හා රු.64,000 ක් අයකර ගැනීමේ කටයුතු නියමිත පරිදි සිදු වී නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ රු.2,718,850 ක් හා මුද්දර ගාස්තු රු.20,000,000 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යය සාධනය**

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-------------------
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 හා 1988 අගෝස්තු 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා 39 ක් හා පළාත් සභාව විසින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා 12 ක් සභාව විසින් වැළඳගෙන තිබුණු අතර සභාව විසින් අතුරු ව්‍යවස්ථා 01 ක් පනවා තිබුණි.

(ආ) කර්තව්‍යයන් ඉටු නොකිරීම
------------------------------
2017 වර්ෂය සඳහා අයවැයගත රු.11,350,000 ක් වූ කර්මාන්ත 30 ක් ඉටුකර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

i. අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.7,692,923 ක් වැයකර තිබූ අතර දිරන/නොදිරන කසළ ටොන් 282 ක් රැස්කර ඉන් දිරන කසළ ටොන් 98 කින් කාබණික පොහොර ටොන් 30 ක් නිෂ්පාදනය කර තිබුණි.පොහොර හා නොදිරන කසළ අලෙවියෙන් පිළිවෙලින් රු.341,070 ක් සහ රු.128,023 ක් හා කසළ බදු වශයෙන් රු.351,418 ක් අයකරගෙන තිබුණි.

ii. ඉකුත් වර්ෂය හා සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂයේදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් එකතු කරන ලද කසළ ප්‍රමාණය සියයට 6 කින් අඩුවී තිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------
“තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030” පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණු බැවින් සභාවට අදාළ තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව පුළුල් දැනුමක් නොතිබුණි. ඒ හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණු නමුත් දිළිඳුකම පිටු දැකීමට සහ ස්වයං රැකියා සඳහා අවශ්‍ය ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. ආදායම් මට්ටම් ස්ථාවර නොවීම, සේවා අවශ්‍යතා පුළුල් වීම නිසා වියදම් වැඩිවීම වැනි හේතූන් මත තිරසර සංවර්ධන ඉලක්ක සඳහා අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සේවයේ නියුතු අනියම් සේවකයින් වෙනුවෙන් 2001 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් රු.73,697 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව දුරකථන/ විදුලි සංදේශ කුළුණුවල උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් සහ වැඩිවන සෑම මීටර් එකකටම රු.100 බැගින් ගාස්තු අයකළ යුතු වුවත්, 2009 වර්ෂයේ ඉදිකළ කුළුණු 06 කින් රු.111,110 ක පෙරසැරි ගාස්තු අඩුවෙන් අයකර තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ වූ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 29 කට අදාළව අනුකූලතා සහතික ලබාගෙන නොතිබීම හේතුවෙන් රු.169,393 ක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබෙන දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 23 කට අදාළව 2017 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබීම හේතුවෙන් රු.69,000 ක් සභාවට අහිමි වී තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 පවරා නොගත් වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ ස්ථාන 04 ක වූ ප්‍රජා ශාලා සහ එම ඉඩම් අක්කර 04 රූඩ් 02 ක් තක්සේරු කිරීමට සහ නිවාස සංවර්ධන අධිකාරියට අයත් මෙම ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් පරිහරණය කරනු ලබන කැබ් රථ 02 ක් සහ කැන්ටර් ලොරියක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3.2 නිශ්ක්‍රීය වත්කම්

රු.550,000 ක් වූ බැකෝ යන්ත්‍රයක් සහ රු.73,500 ක් වූ අත් ට්‍රැක්ටරයක් වර්ෂ 04 ක පමණ කාලයක සිට භාවිතයෙන් තොරව පැවතුණි.

## 3.4 හඳුනාගත් පාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සභාව සතු පුස්තකාල 10 කින් අස්ථානගත වී තිබුණු රු.34,653 ක් වූ පොත් 164 ක් සම්බන්ධයෙන් වූ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 සැපයීම් හා සේවා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන අත්පොතෙහි 3.4 (අ) වගන්තියට පටහැනිව හා ප්‍රසම්පාදන කාර්යය පටිපාටි අනුගමනය නොකර රු.128,928 ක ගිණි නිවන උපකරණ මිලදීගෙන තිබුණි.

(ආ) නව කාර්යාල ගොඩනැගිල්ලට රු.1,206,338 ක් වූ සන්නිවේදන උපකරණ හා CCTV කැමරා පද්ධතිය මිලදී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ඇ) ඡායා පිටපත් යන්ත්‍රයක් මිලට ගැනීමේ මිල ගණන් ලබා නොගෙන පුර නැගුම ව්‍යාපෘතියේ මිල ගණන් මත පදනම්ව රු.142,013 කට ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව රු.666,540 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ඉ) ඝණ අපද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා පොහොර කවර 7,000 ක් මිලදී ගැනීමට රු.349,000 ක් ගෙවීම් කර තිබුණු අතර, එම මිල ගණන් ඇගයීම් 2016 දෙසැම්බර් 29 දින සිදුකළ බවට වාර්තා කර තිබුණද, සැපයුම්කරුගේ මිල ගණන් 2016 දෙසැම්බර් 30 දින ලැබී තිබුණි.

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පල්ලව දම්පිටිය හීන්පල්ලගම මායිම් පාර සංවර්ධනය කිරීම සඳහා රු.990,922 ක් ගෙවීම් කර තිබුණි. මෙම සංවර්ධිත මාර්ගයේ මීටර් 10x2.6 ක පමණ ප්‍රමාණයක් ගිලා බැස තිබෙන බව 2018 ජනවාරි 28 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.141,626,266 ක අයවැයගත නොවූ කර්මාන්ත 115 ක් ඉටුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 07 ක් සඳහා සලසා තිබුණු රු.4,300,000 ක ප්‍රතිපාදන ඉක්මවා රු.6,415,254 ක් වැයකර තිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

1988 (මූල්‍ය හා පරිපාලන) රීති 5 (7) ප්‍රකාරව අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කර තිබුණද, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණ ක්‍රියාවලිය | i. ස්ථාවර වත්කම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම හා ගිණුම්ගත නොකිරීම.<br>ii. ජංගම වත්කම් අඩුවෙන් ගිණුම්ගත කිරීම.<br>iii. ආදායම් වැරදි ලෙස ගිණුම්ගත කිරීම. |
| (ආ) ආදායම් පාලනය හා ආදායම් රැස් කිරීම | ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | i. නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම.<br>ii. ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන නොකිරීම.<br>iii. ස්ථාවර වත්කම්වල අගය තක්සේරු කර ගිණුම්ගත නොකිරීම. |
| (ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් පරිදි මිලදී ගැනීම් සිදු නොකිරීම. |
| (ඉ) අයවැය පාලනය | ඇස්තමේන්තු නොකළ කාර්යයන් සිදු කිරීම. |